# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1907/10 - 2015 මාර්තු මස 23 වැනි සඳුදා - 2015.03.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනත**

8(1) වගන්තිය යටතේ කරන නියමය

2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනතේ 3 වන වගන්තිය යටතේ අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අංක 1904/41 සහ 2015.03.04 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයක් මඟින් දක්වා ඇති විශේෂ සමථ මණ්ඩල ඇතුළත සම්පූර්ණයෙන් ම හෝ කොටසක් වශයෙන් උද්ගත වන විෂය වස්තුවේ මූල්‍ය වටිනාකම, අංක 1901/8 සහ 2015.02.10 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන නියමයන් මඟින් තීරණය කරන ආරවුල් වර්ගවලට අයත් ආරවුලක් සම්බන්ධයෙන් රුපියල් 2,000,000කට අඩු විය යුතු බවට මෙම නියමය මඟින් ප්‍රකාශ කරමි.

,
ආචාර්ය විජයදාස රාජපක්ෂ,
ජනාධිපති නීතිඥ,
අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍ය.

2015 මාර්තු මස 19 වැනි දින,
කොළඹ දීය.

04 - 233/1

---

**2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනත**

2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනතේ 4(2) වන වගන්තිය සමග කියවිය යුතු 27 වන වගන්තිය යටතේ අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් කරන නියෝග.

,
ආචාර්ය විජයදාස රාජපක්ෂ,
ජනාධිපති නීතිඥ,
අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍ය.

2015 මාර්තු මස 19 වැනි දින,
කොළඹ දීය.

1A - G 21257 — 52 (2015/03)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

නියෝග

1. මෙම නියෝග 2015 අංක.......................................... දරන සමථ මණ්ඩල (සමථකරුවන්ගේ සුදුසුකම්) නියෝග ලෙස හඳුන්වනු ලැබේ.

2. අංක 1904/41 සහ 2015.03.04 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් සඳහන් කරන විශේෂ සමථ මණ්ඩලවල සමථකරුවන්ගේ මුල මණ්ඩලයක සාමාජිකයෙකු ලෙස පත්කිරීමට සුදුසුකම් ලබන තැනැත්තකු වයස අවුරුදු 35ට වැඩි සහ අවුරුදු 70ට අඩු සහ

(අ) යම් ලිඛිත නීතියක් මගින් හෝ යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් වෘත්තීය සුදුසුකම් සහිතව

(ආ) රාජ්‍ය සේවයේ නිලධාරියකු වශයෙන් සේවය කර ඇති හෝ සේවය කරමින් සිටින තැනැත්තකු විය යුතු ය.

04 - 233/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.